# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது **EXTRAORDINARY**

අංක 1038/16 – 1998 ජූලි 30 වැනි බ්‍රහස්පතින්ද – 1998.07.30

1038/16 ஆம் இலக்கம் — 1998 ஆம் ஆண்டு யூலை மாதம் 30 ஆம் திகதி வியாழக்கிழமை

No. 1038/16 – THURSDAY, JULY 30, 1998

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) **(Published by Authority)**


# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. – බී. 4/96.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 සහ 29 වන වගන්ති සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1998 ජූලි මස 29 වන දින.
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1998 මීගමුව කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග (මෙහි මින්මතු ''මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලබන) මෙහි උපලේඛනයේ වඩා පූර්ණ ලෙස විස්තර කරනු ලබන මීගමුව කලපුවේ කළමනාකරණ ප්‍රදේශයේ ධීවර මෙහෙයුම් කටයුතුවලට අදාලව බල පැවැත්විය යුතුය.

3. වෙනත් ලිඛිත නීතියක මීට පටහැනිව කුමක් සඳහන්ව තිබුන ද අංක 948/25 හා 1996 නොවැම්බර් මස 07 වන දින දරන ;අති විශෙෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ ධීවර මෙහෙයුම් කටයුතුවල යෙදීම සඳහා නිකුත් කරනු ලැබූ සියලු බලපත්‍රවල ''මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය සඳහා වලංගුය.'' යන කොන්දේසිය පිටසන් කර ඇත්තේ නම් මිස, ඒ සියලුම බලපත්‍ර මීගමුව කලපුව ප්‍රදේශය ඇතුළත වලංගු නොවිය යුතුය.

4. මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය තුළ පහත දැක්වෙන ධීවර ආම්පන්න සහ ක්‍රම උපයෝගී කර ගනිමින් ධීවර මෙහෙයුම් සිදු කිරීම තහනම් කරනු ලැබේ :–

(අ) ට්‍රෝල් (අදින) දැල් මගින් කරනු ලබන ධීවර මෙහෙයුම් ;
(ආ) තල්ලු කරන දැල් යොදා ගනිමින් කරනු ලබන ධීවර මෙහෙයුම් ;
(ඇ) මොක්සි දැල් ධීවර මෙහෙයුම් ;
(ඈ) කරමල් දැල් හෝ ත්‍රිත්ව දැල් මගින් කොරල් පර හෝ ගල්පර මත මසුන් ඇල්ලීමේ මෙහෙයුම් ;
(ඉ) පොලිකීට පණුවන් හෑරීම.

5. මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය තුළ ත්‍රිත්ව දැල් භාවිතා කළයුතු වන්නේ පස්වරු 6.00 සිට පෙරවරු 6.00 දක්වා පමණක් වේ.

6. ධීවර මෙහෙයුමක දී භාවිතා කළ හැකි ත්‍රිත්ව (ඩිස්කෝ) දැල්වල උඩුමන්දේ උපරිම දිග මීටර් 600 නොඉක්මවිය යුතුය.

7. ත්‍රිත්ව දැල්වල උඩුමත්දේ සංයුක්ත දිග මීටර් 600ට වැඩිවන ත්‍රිත්ව දැල් කලපුව තුළ ධීවර යාත්‍රාවක කිසිවකු විසින් සන්තකයේ තබාගෙන සිටීම එම ක්‍රියාකරු 6 වන නියෝගය කඩකර ඇති බවට සාක්ෂියක් විය යුතුය.

8. කට්ටු දැල්, විසි දැල්, කකුළුඅතංගු, මලිස්සන් අතංගු, බිලී පිති, අත්යොත්, කරක්ගෙඩිය සහ පන්දම, ඉරටිය සහ කෙමන යන ධීවර පන්න ක්‍රම හැරුණු විට සෙසු සියලුම ධීවර මෙහෙයුම්, මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශයේ (සහ දූපත් ද ඇතුළත්ව) වෙරළ සිට මීටර් එකසිය පනහක් දක්වා ප්‍රදේශය තුළ තහනම් විය යුතුය.

9. ධීවර මෙහෙයුමක් සිදුකරන විට, එම මෙහෙයුමට සම්බන්ධ ධීවරයාත් ඒ ස්ථානයේ රුඳී නොසිටින්නේ නම්, ධීවර මෙහෙයුම්කරුගේ නම සහ බලපත්‍ර අංකය උසින් අඟල් දෙකක් හා පළලින් අඟල් එකහමාරකට නොඅඩු ප්‍රමාණයේ අකුරුවලින් මීටර් 50ක අන්තරයක් සිටින සේ (දැලට සම්බන්ධ කර ඇති) ඉපිලිවල පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට සවිකොට ප්‍රදර්ශනය කළ යුතුය.

10. මස් අතු කට්ටා සහ ජාකොටු ධීවර මෙහෙයුම්කරුවන් තම තම සහ බලපත්‍ර අංක උසින් අඟල් දෙකක් හා පළලින් අඟල් එකහමාරකට නොඅඩු ප්‍රමාණයේ අකුරුවලින් ලෑල්ලක පින්තාරු කොට පහසුවෙන් හඳුනාගත හැකි අයුරින් සවිකොට ප්‍රදර්ශනය කළ යුතුය.

11. මෙම නියෝගවල –

ධීවර මෙහෙයුම්කරු යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 948/25 හා 1996 නොවැම්බර් මස 07 වන දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝගවල විධිවිධාන යටතේ ධීවර මෙහෙයුම්වල යෙදීම පිණිස වලංගු බලපත්‍රයක් දරන තැනැත්තෙක් අදහස් වේ.

### උපලේඛනය

(2 වන නියෝගය)

#### මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය හැඳින්වීම

මෙම නියෝගවල මීගමුව කලපුව කළමනාකරණ ප්‍රදේශය වශයෙන් හඳුන්වනු ලබනුයේ මුහුදු දෙසට සීමාව කුට්ටිදූව සහ දූව තුඩුව අතර සෘජුව ඇඳිය හැකි කල්පිත රේඛාවකින් ද, කලපුව තුළ සීමා මෙම ජලාශයට ගලා බසින ගංගා සහ ඇළ මෝයවල් ද වඩදිය ජලමට්ටම සීමාවෙන් සමන්විත ජල ප්‍රදේශයකි.

08 – 180

# பகுதி I : தொகுதி (I) – பொது

## அரசாங்க அறிவித்தல்கள்

எல். டி. — பி. 4/96.

1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில், நீரியல் வளங்கள் சட்டம்

1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில், நீரியல் வளங்கள் சட்டத்தின் 61 ஆவது பிரிவுடன் சேர்த்து வாசிக்கப்பட வேண்டிய 28 ஆம் மற்றும் 29 ஆம் பிரிவுகளின் கீழ் கடற்றொழில், நீரியல் வளத்துறை அபிவிருத்தி அமைச்சரினால் ஆக்கப்பட்ட ஒழுங்குவிதிகள்.

மஹிந்த ராஜபக்ஷ,
கடற்றொழில், நீரியல் வளத்துறை
அபிவிருத்தி அமைச்சர்.

கொழும்பு,
1998 யூலை 29.

### ஒழுங்குவிதிகள்

1. இவ் ஒழுங்குவிதிகள் 1998 ஆம் ஆண்டின் நீர்கொழும்பு கடனீரேரி (களப்பு) கடற்றொழில் முகாமைத்துவ இடப்பரப்பு ஒழுங்குவிதிகள் என எடுத்துக் காட்டப்படலாம்.

2. இவ் ஒழுங்குவிதிகள் இதற்கான அட்டவணையில் மேலும் விரிவாக விபரிக்கப்படும் (இதன் பின்னர் நீர்கொழும்பு கடனீரேரி (களப்பு) முகாமைத்துவ இடப்பரப்பு எனக் குறிப்பிடப்படும்) நீர்கொழும்பு கடனீரேரி (களப்பு) முகாமைத்துவ இடப்பரப்பில் கடற்றொழில் தொழிற்பாடுகளுக்கு ஏற்புடைத்தாதல் வேண்டும்.